

# විදර්ශනා
## නිවන් මග

2 වෙනි කොටස

**ලබුණෝරුව ආරණ්‍යසේනාසන වාසී මහ තෙර නමක වන පූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන්වහන්සේ පැවැත්වූ විශේෂ භාවනා පුහුණු ධර්ම මාර්ගෝපදේශනා මාලාවක් මෙලෙස ඉදිරිපත් කෙරෙන්නේ බුදුදහම පිළිබඳ උනන්දුවක් දක්වන්නා වූ ද, එමගින් විමුක්තියක් අපේක්ෂා කරන්නා වූ ද, සත්‍ය ගවේෂණයේ යෙදෙන්නා වූ ද 'සන්නස' පාඨකයන්ගේ අර්ථ සිද්ධිය වෙනුවෙනි. බුදු දහමේ පෙන්වා දෙන දුක නැති කිරීම හෙවත් නිවන් දැකීම යනු ජීවිත කාලය පුරාවට සිල් ගනිමින්, භාවනා කරමින් සිට අනතුරු භවයක අත්දකින දෙයක් නොවන බවත්, අනුපූර්ව ශික්ෂණයෙන් අනුපූර්ව ප්‍රතිපදාවෙන් සහ අනුපූර්ව ක්‍රියාවෙන් යම් කාලයක් තුළ ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙන් පසු සාක්ෂාත් කරගෙන ඉන් පසු ජීවිතය නිදුකින් ගත කළ හැකි විමුක්තියක් බවත් සුදස්සන ස්වාමින්වහන්සේ අවධාරණය කරති. මෙම කරුණ සම්ප්‍රදායික බෞද්ධ ජනතාවගේද, බුදුදහම විවේචනය කරන විදග්ධ යැයි කියාගන්නා විවිධ මතධාරීන්ගේද විමංසාව සඳහා අවකාශය විවර කිරීමද මෙමගින් අපේක්ෂිතය.**

පෙර කලාපය හා බැඳේ...

### ස්කන්ධ රූප සහ උපාදානස්කන්ධ රූප

## විදර්ශණාවෙන් උපාදාන රූප ඉවත් කරන අයුරු

ස්කන්ධ රූපය (ඇස ඉදිරියට පැමිණෙන, ඇස දකින රූපය) ආහාර ප්‍රත්‍යයෙන් හටගනී. ආහාර නිරුද්ධ වූ විට නිරුද්ධ වේ. එය ධර්මතාවයකි. නමුත් ඒ රූපය දකින්නා තුළ සත්‍ය නොදන්නාකම (අවිද්‍යාව ඇතිවිට) හෝ ඒ රූප රසවිඳගැනීමේ සිත ඇතිවිට (තණ්හාව ඇතිවිට) ස්කන්ධ රූපය උපාදානය කොට ගැනීමක් (සිතින් අල්ලාගැනීමක්) සිදුවේ. හෙවත් උපාදානස්ඛන්ධයක් ගොඩනඟා ගැනීමක් සිදුවේ. උපාදානස්ඛන්ධ රූප යැයි කියන්නේ එසේ සිතින් දැඩිව අල්ලා ගන්නා රූපයන්ටය. ස්කන්ධ රූප යැයි කියන්නේ එසේ සිතින් අල්ලා ගැනීමට ප්‍රත්‍ය වූ ඇස ඉදිරිපිටට පැමිණි රූපයන්ටය. රූපයක් උපාදානය වුවහොත් ඇස ඉදිරියට පැමිණි රූපය (ස්කන්ධ රූපය) නිරුද්ධ වුවද උපාදානස්ඛන්ධ රූපය එසේ නිරුද්ධවීමක් සිදු නොවේ. ඊට හේතුව වන්නේ මේ රූප දෙක ප්‍රත්‍ය දෙකකින් සැදී තිබීමයි. ඇස් ඉදිරිපිටට පැමිණි රූපය ආහාර ප්‍රත්‍යයෙනි. උපාදාන රූපය තණ්හා ප්‍රත්‍යයෙනි. මේ දෙකෙහි ඇති වෙනස නොදන්නා දකින්නේ ස්කන්ධ රූපයද උපාදාන රූපයද දෙකම එකක් ලෙසිනි. (එහෙත් බාහිර ලෝකයේ ඇත්තේ ස්කන්ධ රූපයකි. අපගේ අභ්‍යන්තර ලෝකයේ ඇත්තේ උපාදානස්ඛන්ධ

38 වන පිටට





